ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය.

පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ සහතික පත්‍ර අවසාන පරීක්ෂණය -2007

**ESC 1128/1139 -** පෙර පාසල් සංවිධානය හා නිවස හා
පාසල අතර සම්බන්ධතාවය

කාලය - පැය 02 යි.

---

දිනය - 2007.06.17 වේලාව - පෙ.ව.10.00 - මධ්‍යාහ්න 12.00 දක්වා

---

ප්‍රශ්න හතරකට පමණක් (04) පිළිතුරු සපයන්න.

01. පහත සඳහන් කරුණු ආශ්‍රිතව පෙර පාසලකට අවශ්‍ය වන අවම ලක්ෂණ පැහැදිලි කරන්න.

   අ. ගොඩනැගිලි
   ආ. ගෘහ භාණ්ඩ හා පහසුකම්
   ඇ. එළිමහන් ක්‍රීඩාවලට පහසුකම්

(ලකුණු 8 x 3 + 1 = 25 යි.)

02. අ. ළමයින්ගේ ඉගෙනුමට උපරිම අවස්ථා ලබා ගැනීමට හැකිවන පරිදි, පංති කාමරයේ ළමයින්ගේ අසුන් නිසි ලෙස පිළියෙළ කරන අන්දම විස්තර කරන්න.

(ලකුණු 15 යි.)

   ආ. එසේ පිළියෙළ කිරීමෙන් ළමයින්ට ලැබෙන වාසි මොනවාදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 10 යි.)

03. අ. පෙර පාසලක පවත්වාගෙන යායුතු <u>ආයතන වාර්තා පහක්</u> විස්තර කරන්න.

(ලකුණු 15 යි.)

   ආ. මෙලෙස වාර්තා තබා ගැනීමෙන් ලබා ගැනීමට හැකි වාසි මොනවාදැයි සාකච්ඡා කරන්න.

(ලකුණු 10 යි.)

04. පහත සඳහන් මාතෘකා ගැන විස්තර සටහන් ලියන්න.

   **i.** පංති ක්‍රියාකාරකම් සඳහා ළමයින් කණ්ඩායම් කිරීමෙන් ලැබෙන වාසි.
   **ii.** දිවා සුරැකුම් මධ්‍යස්ථානයක පාලිකාවට පැවරෙන වගකීම්.
   **iii.** පෙර පාසලක සති සැලැස්මක් තබා ගැනීමෙන් ලැබෙන ප්‍රයෝජන.
   **iv.** දෙමාපියන් සමග යහපත් සම්බන්ධතාවක් පවත්වා ගැනීමේ වැදගත්කම.

(ලකුණු **6 x 4 + 1=** 25 යි.)

05. අ. ළමයින්ගේ ප්‍රගති සටහන් වාර්තාවක් පවත්වාගෙන යායුතු ආකාරය විස්තර කරන්න.

(ලකුණු 15 යි.)

ආ පෙර පාසල් ගුරුවරියකගේ ස්වයං ඇගයීම් වාර්තා සටහනට ඇතුලත් කලහැකි කරුණු දහයක් ලියන්න.

(ලකුණු 10 යි.)

06. අ. දෙමව්පියන් දැනුවත් කිරීම සඳහා වැඩසටහනක් සංවිධානය කරන අන්දම පැහැදිලි කරන්න.

(ලකුණු 15 යි.)

ආ. බාල ළමයින්ගේ සංවර්ධනය පිළිබඳ ඔබ දෙමව්පියන්ට දෙන වැදගත් පණිවිඩ දෙකක් ලියන්න.

(ලකුණු 10 යි.)

- හිමිකම් ඇවිරිණි. -